ස.සේ.කො.චක්‍රලේඛ අංක 01 /2020

මගේ අංකය : ස.සේ.කො./5/1/iii වෙළුම,
සමූපකාර සේවක කොමිෂන් සභාව (වයඹ),
නව පළාත් සභා ගොඩනැගිල්ල,දෙවන මහල,
කුරුණෑගල.
2020.01. 07

වයඹ පළාතේ සියලුම විවිධ සේවා සමුපකාර සමිති,
පළාත් සමූපකාර ග්‍රාමීය බැංකු සංගමය හා,
වයඹ සමූපකාර මහා සංගමය, ස.ණ.ස.සංගම්,
ස.ණ.ස. සමිති, වෙනත් සමිති හා සංගම් වල ගරු සභාපති හා
සාමානාධිකාරී වරුන් වෙත,

## සමූපකාර සේවකයින් සඳහා 2020 වර්ෂයේ නිවාඩු

සමූපකාර සේවක කොමිෂන් සභා රෙගුලාසි මාලාව අනුව සමූපකාර සේවකයින්ට හිමිකම් ඇති ප්‍රසිද්ධ නිවාඩු වූ කලී සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ ගරු කම්කරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පමුණුවන ලද දිනයන්ම වේ. මේ අනුව පහත සඳහන් දිනයන් සමූපකාර සේවකයින් සඳහා නිවාඩු දින වශයෙන් කොමිෂන් සභා නියමය පරිදි දන්වමි.

| | | | | |
|---|---|---|---|---|
| 1. | ජනවාරි | 15 | බදාදා | - දෙමළ තෛපොන්ගල් දිනය(මීලා-දුන් නබි) නබි නායක තුමාගේ ජන්ම දිනය |
| 2. | පෙබරවාරි | 04 | අඟහරුවාදා | - ජාතික දිනය. |
| 3. | අප්‍රේල් | 12 | ඉරිදා | - සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනයට පෙර දිනය. |
| 4. | අප්‍රේල් | 13 | සඳුදා | - සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනය. |
| 5. | මැයි | 01 | සිකුරාදා | - ලෝක කම්කරු දිනය |
| 6. | මැයි | 07 | බ්‍රහස්පතින්දා | - වෙසක් පුර පසළොස්වක පෝය දිනය. |
| 7. | මැයි | 08 | සිකුරාදා | - වෙසක් පුර පසළොස්වක පෝය දිනයට පසු දිනය. |
| 8. | ඔක්තෝබර් | 30 | සිකුරාදා | - මීලා - දුන් - නබි-(නබි නායක තුමාගේ උපන් දිනය). |
| 9. | දෙසැම්බර් | 25 | සිකුරාදා | - නත්තල් උත්සව දිනය. |

02. ඉහතින් දැක්වූ විධි විධාන වලට අතිරේකව සේවකයින් අතරින්,
* හින්දු භක්තිකයකුට දීපවාලී දිනය ද,
* මුස්ලිම් භක්තිකයකුට රාමසාන් උත්සවය හා හජ්ජි උත්සවය පැවැත්වෙන දිනය ද,
* ක්‍රිස්තු භක්තිකයකුට මහ සිකුරාදා සහ පාස්කු ඉරිදා වශයෙන් හැඳින්වෙන දිනය ද,

සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු වශයෙන් දිය හැකිය.

03. පසළොස්වක පොහොය දිනය වැටුප් සහිත නිවාඩු දිනයක් ලෙස සැලකිය යුතුය. පෝය නිවාඩු දිනයක් සති නිවාඩු දිනකට හෝ ප්‍රසිද්ධ නිවාඩු දිනයකට වැටුනහොත් ඒ සඳහා අතිරේක නිවාඩුවක් හිමි නොවේ. තවද, සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් විසින් සමූපකාරිකයින්ගේ දිනය වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන දිනයද නිවාඩු වශයෙන් දිය යුතුය. මීට අමතරව රජය විසින් අවස්ථාවෝචිත පරිදි "රජයේ නිවාඩු" දිනයන් ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන දිනයන් සඳහා සිය සේවකයින්ට නිවාඩු දෙන ලෙස ඉල්ලීමක් කළ හොත් එවැනි අවස්ථාවල සමූපකාර සමිති වල අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි තම සේවකයින්ට නිවාඩු දීම පිළිබඳව තීරණය කළ හැක.

04. උක්ත දිනයන් නිවාඩු දින වශයෙන් යොදාගෙන ඇති බැවින්, පාරිභෝගිකයින්ගේ පහසුව තකා යම් සමිතියක් කැමැත්තේ නම් සමිති කාර්යාල හෝ ප්‍රාදේශිකයන් මේ දින වල විවෘතව තැබීමටත්, එම දින වල වැඩ කිරීම සඳහා සේවකයින්ට උපදෙස් දීමටත් කොමිෂන් සභාවේ අනුමැතිය ලැබේ. එසේ ක්‍රියා කරනු ලැබූ විට දී ඉහත සඳහන් පරිදි සේවයේ යොදාගත් සේවකයින්ට එසේ සේවයේ යොදා ගත් දින ගණනට සමාන දින ගණනක් සම්පූර්ණයෙන්ම වැටුප් සහිතව ඊළඟට එන දින 30 ඇතුලත දී නිවාඩු ලබා දිය යුතුය. මෙසේ සමිති කාර්යාලයක්, ව්‍යාපාරික ස්ථානයක් විවෘතව තබන අවස්ථාවේදී සේවයේ යෙදවීමට උපදෙස් දෙනු ලැබුවේ මුළු සේවක සංඛ්‍යාවම වුවත්, ඉන් කොටසක් වුවත්, නොපමාව ඒ බැව් කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතුය.

05. ඉහත දැක් වූ නිවාඩු දින වලින් කිසිවක් සමිතියේ සතිපතා දෙන නිවාඩු 1 ½ තුළට ඇතුලත් වුවහොත් ඒ වෙනුවෙන් පිළිවෙලින් අඩ දිනක් හෝ සම්පූර්ණ දිනක් නිවාඩු වශයෙන් ඊළඟට එන දින 30 ඇතුලත දී සේවකයින්ට නිවාඩු වශයෙන් ලබා දිය යුතුය. මීට විකල්ප වශයෙන් දෙපක්ෂයේ එකඟතාවය ඇතිව ඒ වෙනුවට දින භාගයක් හෝ එක් දිනක වැටුප හෝ අවස්ථාවෝචිත පරිදි ගෙවීම් කළ හැකි වේ.

කොමිෂන් සභා නියමය පරිදි,

රේණුකා පී. විජේරූප.
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ)

<u>පිටපත්</u>- :

1. ප්‍රධාන ලේකම් - වයඹ පළාත. - කා. දැ.පි.
2. ලේකම්, සමුපකාර සංවර්ධන, වෙළඳ,ඉඩම්,විදුලිබල හා බල ශක්ති , ක්‍රීඩා හා යෞවනකටයුතු, සංස්කෘතික, කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය (වයඹ) - කා. දැ.පි.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්(වයඹ පළාත) - දැ.ගැ.පි - අ.ක.ස.
4. සියළුම සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.ගැ.පි.- අ.ක.ස.
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - කුරුණෑගල,හලාවත,කුලියාපිටිය,මහව. - දැ.ගැ.පි.- අ.ක.ස.

cc
2020 . 01 . 03 .